# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021
2024 නොවැම්බර් / දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා

(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)

**ව්‍යවහාරික ඡායාරූපකරණය IMAT – E1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. කිසියම් සිදුවීමක් (Incident) ප්‍රවෘත්තියක් (News) වන්නේ කෙසේදැයි විස්තර කර පුවතකට ඡායාරූපයක් එක් කිරීමෙන් කුමන පරමාර්ථයක් ඉටුකර ගත හැකි දැයි පහදන්න.

02. ආලේඛ්‍ය ඡායාරූපකරණය (Portrait Photography) යනු කුමක්දැයි පැහැදිලි කොට, ආලේඛ්‍ය ඡායාරූපකරණයේ දී ඡායාරූප ශිල්පියෙකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි විස්තර කරන්න.

03. චිත්‍රාගාර ඡායාරූපකරණය (Studio Photography) හා එළිමහන් ඡායාරූපකරණය (Outdoor Photography) යනු කුමක්දැයි හඳුන්වා චිත්‍රාගාර ඡායාරූපකරණයේ අවශ්‍යතාව පිළිබඳ විස්තර කරන්න.

04. තාක්ෂණික දියුණුවත් සමඟ ගුවන් ඡායාරූපකරණයේ (Arial Photography) ප්‍රබල වෙනස්කම් සිදුවී ඇත. ගුවන් ඡායාරූපකරණයේ අවශ්‍යතාව පිළිබඳ හඳුන්වා, නව තාක්ෂණය ඒ සඳහා භාවිත කරන ආකාරය විස්තර කරන්න.

05. වෘත්තීය මංගල ඡායාරූපකරණ ශිල්පියෙකු සතු වගකීම පිළිබඳ පැහැදිලි කර, වර්තමානයේ මංගල ඡායාරූප ශිල්පියෙකු මුහුණ දෙන අභියෝග මොනවාදැයි විස්තර කරන්න.

06. "කැමරාවක් හා කාචයක් මිලදී ගැනීමෙන් පමණක් වනජීවී ඡායාරූප ශිල්පියෙකු බවට පත්විය නොහැකිය." ඉහත කියමන හා ඔබ එකඟ වන්නේද? විස්තර කරන්න.

07. වෛද්‍ය විද්‍යාවේදී රෝග හඳුනාගැනීම සඳහා ඡායාරූපකරණය භාවිත කරන අවස්ථා මොනවාදැයි නිදර්ශන සහිතව විස්තර කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා දෙකක් (02) තෝරා කෙටි සටහන් ලියන්න.

    i. ළමා ඡායාරූපකරණය - Child Photography
    ii. ක්‍රීඩා ඡායාරූපකරණය - Sport Photography
    iii. ස්වභාව ඡායාරූපකරණය - Nature Photography
    iv. නිසලජීවී ඡායාරූපකරණය - Still Life Photography
    v. ගෘහ නිර්මාණ ඡායාරූපකරණය Architecture Photography

*********************************